ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යවසායකත්වය සහ කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (ESBM)

**AFC 2406 – ව්‍යවසායකයින් සඳහා ගිණුම්කරණය සහ මූල්‍ය**
**අවසාන විභාගය - 2025/2026**
**කාලසීමාව – පැය දෙකකි (02)**

*දිනය: 17/05/2026* *කාලය: පෙ.ව. 09.30 – පෙ.ව. 11.30*

උපදෙස්:

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සමන්විත වේ. පළමු ප්‍රශ්නය (01) ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්නවලට සමාන ලකුණු (එකකට ලකුණු 25 බැගින්) හිමි වේ.
- ප්‍රශ්න පත්‍රය පිටු හතරකින් (04) සමන්විත වේ.
- කරුණාකර පිළිතුරු පත්‍රයේ ඉඩ සපයා ඇති ස්ථානයේ ඔබේ විභාග අංකය නිවැරදිව ලියන්න.
- සියලුම පෙර වැඩ පැහැදිලිව සඳහන් කළ යුතුය.
- වැඩසටහන්ගත කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ඇත.

ප්‍රශ්න අංක **01**

අ) ව්‍යවසායකයින්ට නිසි මූල්‍ය වාර්තා පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වීමට හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

ආ) 2026/03/31 දිනට රවිඳු ට්‍රේඩර්ස් හි ගිණුම් පොත්වලින් උපුටාගත් ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| 01.04.2025 දිනට ප්‍රාග්ධනය | | 16,600 |
| දේපළ පිරියත හා උපකරණ(පිරිවැයට) | | |
| මෝටර් රථ | 8,000 | |
| කාර්යාල උපකරණ | 12,000 | |
| 01.04.2025 දිනට සමුච්චිත ක්ෂයවීම් | | |
| මෝටර් රථ | | 2,000 |
| කාර්යාල උපකරණ | | 4,000 |
| බැංකුවේ ඇති මුදල් | 2,500 | |
| අතැති මුදල් | 4,000 | |
| ණයගැතියන් සහ ණයහිමියන් | 7,500 | 3,200 |
| ගැණුම් සහ විකුණුම් | 12,500 | 32,000 |
| 01.04.2025 දිනට තොගය | 6,000 | |
| 10% බැංකු ණය | | 2,500 |
| වැටුප් | 4,700 | |
| ගොඩනැගිලි කුලිය | 2,700 | |
| විදුලි වියදම් | 1,900 | |
| ලද කොමිස් | | 1,500 |
| | **61,800** | **61,800** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

1. 2026 මාර්තු 31 වන දිනට අවසන් තොගයේ වටිනාකම රු. 5,500,000 ක් වන අතර එහි ශුද්ධ උපලබ්ධිත වටිනාකම (NRV) රු. 5,000,000 කි.
2. පහත සඳහන් අනුපාත යටතේ සරල රේඛා ක්‍රමය භාවිතා කරමින් වාර්ෂිකව දේපල පිරියත හා උපකරණ ක්ෂය කළ යුතුය.
   - මෝටර් රථ: 20%
   - කාර්යාල උපකරණ: 10%
3. ව්‍යාපාරය විසින් බැංකු ණය ලබාගෙන ඇත්තේ 2025 ඔක්තෝබර් 1 වන දින ය.
4. වසර අවසානයේදී, වත්මන් වර්ෂය සඳහා රු. 100,000 ක විදුලි වියදම් තවදුරටත් ගෙවීමට ඇත.
5. 2025 අප්‍රේල් 1 වන දින සිට මාස 18 ක කාලයක් සඳහා කුලිය ගෙවා ඇත.
6. වර්ෂය තුළ ලැබුණු කොමිස් මුදලින් 60% ක් පමණක් වත්මන් ගිණුම්කරණ කාලයට අදාළ වන අතර, ඉතිරි 40% ඊළඟ ගිණුම්කරණ කාලයට අදාළ වේ.
7. ව්‍යාපාරය රුපියල් 500,000 ක් බොල් ණය ලෙස කපා හැරීමට තීරණය කර ඇත. මීට පෙර කිසිදු අඩමාණ ණය ප්‍රතිපාදනයක් නොතිබූ බැවින්, මෙම වර්ෂයේ සිට ඉතිරි ණයගැතියන් මත 5%ක අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනයක් පවත්වාගෙන යාමට ව්‍යාපාරය තීරණය කර ඇත.

අවශ්‍ය වන්නේ: 1. 2026/03/31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රවිඳු ට්‍රේඩර්ස් හි ආදායම් ප්‍රකාශය.
2. 2026/03/31 දිනට රවිඳු ට්‍රේඩර්ස් හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

(ලකුණු 20)

**(ලකුණු 25)**

ප්‍රශ්න අංක **02**

අ) එක් එක් ගනුදෙනුව සඳහා අදාළ ප්‍රාථමික පොත සහ මූලාශ්‍ර ලේඛනය සඳහන් කරන්න.(ලකුණු 05)

| | ගනුදෙනුව |
|---|---|
| 1 | භාණ්ඩ ණයට විකිණුම් |
| 2 | සැපයුම්කරුවෙකුට භාණ්ඩ ආපසු යැවීම |
| 3 | ගනුදෙනුකරුවෙකු විසින් විකුණන ලද භාණ්ඩ ව්‍යාපාරයට ආපසු එවීම |
| 4 | භාණ්ඩ මුදලට විකිණුම් |
| 5 | භාණ්ඩ ණයට ගැණුම් |

ආ) පහත ගනුදෙනු 2026 මාර්තු මාසය සඳහා පෙරේරා මහතාගේ ව්‍යාපාරයට අදාළ වේ.

1) 01/03/2026: පෙරේරා මහතා විසින් මුදල් රු. 500,000ක්, රු. 800,000ක් වටිනා ගබඩා භාණ්ඩ සහ රු. 700,000ක් වටිනා කාර්යාල උපකරණ යොදවා ව්‍යාපාරය ආරම්භ කරන ලදී.
2) 02/03/2026: ව්‍යාපාරය රු. 200,000ක් තැන්පත් කර බැංකු ගිණුමක් විවෘත කළේය.
3) 04/03/2026: සිල්වා මහතාගෙන් රු. 120,000 කට ණයට භාණ්ඩ මිලදී ගන්නා ලදී.
4) 06/03/2026: රු. 60,000 කට භාණ්ඩ මුදලට විකුණන ලදී.
5) 08/03/2026: කමල් මහතාට රු. 90,000 කට භාණ්ඩ විකුණන ලදී.
6) 10/03/2026: කමල් මහතා තම සම්පූර්ණ ණය මුදල පියවීම සඳහා රුපියල් 85,000ක් ගෙවන ලදී.
7) 12/03/2026: චෙක්පතකින් රු. 20,000 ක කුලිය ගෙවන ලදී.
8) 15/03/2026: සිල්වා මහතාට රු. 20,000 ක් වටිනා භාණ්ඩ ආපසු යවන ලදී.
9) 18/03/2026: සිල්වා මහතාට සම්පූර්ණ ණය මුදල පියවීම සඳහා රුපියල් 95,000 ක් චෙක්පතක් මගින් ගෙවන ලදී.
10) 22/03/2026: හිමිකරු පුද්ගලික භාවිතය සඳහා රු. 30,000 ක මුදලක් ආපසු ගත්තේය..

ඉහත ගනුදෙනු මූලික ගිණුම්කරණ සමීකරණයට ඇතුළත් කරන්න (වත්කම් = හිමිකම්+ වගකීම්).

(ලකුණු 20)

**(ලකුණු 25)**

**ප්‍රශ්න අංක 03**

අ) සුදුසු ගිණුම්කරණ සංකල්ප භාවිතා කරමින් හිස්තැන් පුරවන්න.

1) ව්‍යාපාරික ගනුදෙනු හිමිකරුගෙන් වෙන්ව සටහන් කළ යුතු බවට වන සංකල්පය __________ ලෙස හැඳින්වේ.
2) ව්‍යාපාරය දීර්ඝකාලීනව සහ අඛණ්ඩව ක්‍රියාත්මක වන බවට උපකල්පනය කරනුයේ __________ සංකල්පයේය.
3) __________ සංකල්පයට අනුව, ආදායම වාර්තා කළ යුත්තේ මුදල් ලැබුණු විට නොව, එය උපයාගත් විටය.
4) __________ සංකල්පය යටතේ වත්කම් ඒවායේ මුල් පිරිවැයට සටහන් කරයි.
5) වෙනස් කිරීමට සාධාරණ හේතුවක් නොමැති නම්, එක් ගිණුම්කරණ කාල පරිච්ඡේදයකින් තවත් ගිණුම්කරණ කාල පරිච්ඡේදයකට එකම ගිණුම්කරණ ක්‍රම භාවිතා කිරීම අවශ්‍ය කරන සංකල්පය __________ සංකල්පය ලෙස හැඳින්වේ. (ලකුණු 05)

ආ) පහත තොරතුරු තනි නිෂ්පාදනයක් නිෂ්පාදනය කර අලෙවි කරන සමාගමකට අදාළ වේ.

ඒකකයකට විකුණුම් මිල = රු. 120
ඒකකයකට විචල්‍ය පිරිවැය = රු. 80
වසරකට ස්ථාවර පිරිවැය = රු. 400,000
අපේක්ෂිත විකුණුම් = ඒකක 15,000
ව්‍යාපාරය වසරකට රු. 200,000 ක ඉලක්කගත ලාභයක් උපයා ගැනීමට අපේක්ෂා කරයි.

අවශ්‍ය වන්නේ;

1) ඒකකයකට දායකත්වය ගණනය කරන්න.
2) සමච්ඡේද ලක්ෂ්‍යය (BEP) ඒකක වලින් ගණනය කරන්න.
3) සමච්ඡේද ලක්ෂ්‍යය (BEP) රුපියල්වලින් ගණනය කරන්න.
4) ආරක්ෂිත ආන්තිකය ඒකක වලින් සහ රුපියල්වලින් ගණනය කරන්න.
5) රු. 200,000 ක ඉලක්කගත ලාභයක් ලබා ගැනීම සඳහා විකිණිය යුතු ඒකක ගණන ගණනය කරන්න. (ලකුණු 20)

**(ලකුණු 25)**

**ප්‍රශ්න අංක 04**

අ) සංවිධානයක, නිශ්චිත අමුද්‍රව්‍යයක් සඳහා වාර්ෂික ඉල්ලුම ඒකක 24,000 කි. අමුද්‍රව්‍ය අවශ්‍යතා සලකා බැලීමේදී, එක් ඇණවුමක් කිරීමේ පිරිවැය රු. 1,200 ක් වන අතර තොග ඒකකයක් තබා ගැනීමේ පිරිවැය රු. 60 කි. ඒකකයක මිලදී ගැනීමේ වටිනාකම රු. 500 කි. සංවිධානය අඛණ්ඩ තොග පාලන ක්‍රමයක් අනුගමනය කරයි. මෙහි ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) ගණනය කරන්න. (ලකුණු 05)

ආ) 2026 මාර්තු 31 වන දිනට සම්පත් ට්‍රේඩර්ස් හි ශේෂ පිරික්සුමේ ශේෂයන් සමාන නොවූ අතර, රු. 30,000 ක් වූ වෙනස අවිනිශ්චිත ගිණුමට බැර කරන ලදී. පසුව, පහත දෝෂ සොයා ගන්නා ලදී:

1) රුපියල් 15,000 ක විකුණුම්, පොත්වල සම්පූර්ණයෙන්ම සටහන් කර නොමැත.
2) රු. 8,000 ක භාණ්ඩ ගැනුම්, ගැනුම් ගිණුමේ දෙවරක් සටහන් කර ඇත.
3) ණයගැතියෙකුගෙන් ලැබුණු රු. 10,000 ක මුදල මුදල් පොතේ නිවැරදිව ඇතුළත් කර ඇති නමුත් ණයගැතියාගේ ගිණුමේ සටහන් කර නොමැත.
4) ගෙවන ලද රු. 6,000 ක කුලිය, විදුලි බිල්පත් ගිණුමට හර කර ඇත.
5) රුපියල් 7,500 ක භාණ්ඩ මුදලට විකිණුම් මුදල් පොතේ රුපියල් 5,700 ක් ලෙස සටහන් කර තිබුණි.
6) රු. 3,200 ක් වූ දුරකථන ගාස්තු රු. 1,200 ක් අඩුවෙන් සටහන් කර ඇත.

7) ණයගැතියෙකුගෙන් ලැබුණු රු. 7,000 ක මුදල මුදල් පොතේ නිවැරදිව ඇතුළත් කර ඇති නමුත් ණයගැතියාගේ ගිණුමට හර කර ඇත.
8) රු. 2,000 ක දුන් වට්ටමක් ණයගැතියාගේ ගිණුමේ පමණක් සටහන් කර ඇත.
9) රු.5,500ක විකුණුම්, විකුණුම් ගිණුම වෙනුවට ගැණුම් ගිණුමට බැර කර ඇත.
10) රු. 9,000 භාණ්ඩ මුදලට විකිණුම්, විකුණුම් ගිණුමේ රු. 6,000 ක් ලෙස සටහන් කර ඇත.

අවශ්‍ය වන්නේ;

1. වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් ලියන්න
2. අවිනිශ්චිත ගිණුම සකස් කරන්න.

(ලකුණු 20)
**(ලකුණු 25)**

**ප්‍රශ්න අංක 05**

අ) නිමල් ට්‍රේඩර්ස් හි මුදල් පොතේ 2026 මාර්තු 31 වන දිනට රු. 85,000 ක හර ශේෂයක් පෙන්නුම් කර ඇත. බැංකු ප්‍රකාශනයේ එම දිනයේම වෙනස් ශේෂයක් පෙන්නුම් කර ඇත. වෙනස සඳහා හේතු පහත දැක්වේ.

• රුපියල් 12,000 ක නිකුත් කරන ලද චෙක්පත් තවමත් ගෙවීම සඳහා ඉදිරිපත් කර නොමැත.
• රුපියල් 8,500 ක ලැබුණු චෙක්පත් තැන්පත් කර ඇතත් තවමත් බැංකුව විසින් ව්‍යාපාර ගිණුමට බැර කර නොමැත.
• රුපියල් 3,000 ක රක්ෂණයක් සඳහා ස්ථාවර නියෝගයක් මුදල් පොතේ සටහන් කර නොමැත.
• ගනුදෙනුකරුවෙකු විසින් කරන ලද රුපියල් 6,000 ක සෘජු තැන්පතුවක් බැංකුව විසින් පමණක් සටහන් කර ඇත.
• රුපියල් 1,200 ක බැංකු ගාස්තු බැංකු ප්‍රකාශනයේ පමණක් දක්නට ලැබුණි.

1) 2026 මාර්තු 31 දිනට සංශෝධිත මුදල් පොත සකස් කරන්න.
2) 2026 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කරන්න(සංශෝධිත මුදල් පොත් ශේෂය භාවිතා කර).

(ලකුණු 10)

b) සමාගමක් A ව්‍යාපෘතිය සහ B ව්‍යාපෘතිය නම් ආයෝජන ව්‍යාපෘති දෙකක් සලකා බලමින් සිටී. එක් එක් ව්‍යාපෘතිය සඳහා රු. 200,000 ක මූලික ආයෝජනයක් අවශ්‍ය වේ. අපේක්ෂිත මුදල් ගලා ඒම් පහත පරිදි වේ.

| වර්ෂය | A ව්‍යාපෘතිය (රු.) | B ව්‍යාපෘතිය (රු.) |
|---|---|---|
| 1 | 80,000 | 60,000 |
| 2 | 70,000 | 80,000 |
| 3 | 60,000 | 90,000 |
| 4 | 50,000 | 40,000 |

ප්‍රාග්ධන පිරිවැය (වට්ටම් අනුපාතය) 10% කි.

1. A ව්‍යාපෘතිය සහ B ව්‍යාපෘතිය සඳහා පිළිගෙවුම් කාලය(Payback Period) ගණනය කරන්න. ඒ අනුව කුමන ව්‍යාපෘතිය වඩාත් සුදුසුදැයි දක්වන්න.

2. A ව්‍යාපෘතිය සහ B ව්‍යාපෘතිය සඳහා ශුද්ධ වර්තමාන අගය (NPV) ගණනය කරන්න. ඒ අනුව කුමන ව්‍යාපෘතිය වඩාත් සුදුසුදැයි දක්වන්න.

(ලකුණු 15)
**(ලකුණු 25)**
මුළු ලකුණු= **100**

*-සියලු හිමිකම් ඇවිරිණි-*